# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1760/9 - 2012 මැයි මස 29 වැනි අඟහරුවාදා - 2012.05.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම

අවසරය ලබා නොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

සින්නත්තුරයි යෝගේන්ද්‍රලිංගම් නම් වූ සභිකයා අයත්වන ස්වාධීන කණ්ඩායම් නායකයාට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ කණ්ඩායමට අයත් ඒ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65 අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී කණ්ඩායම් නායකයා විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2008 මාර්තු මස 10 වැනි දින මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී තෝරා පත් කරගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් සුබ්‍රමනියම් සිවලිංගම් මහතා ඒ පුරප්පාඩුව ඇති වූ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව.

2012 මැයි මස 19 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

06 - 507

1A - G 016098— 350 (2012/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.